# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,296 - 2022 සැප්තැම්බර් මස 02 වැනි සිකුරාදා - 2022.09.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1082 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 1083 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1084 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1090 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 සැප්තැම්බර් මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 සැප්තැම්බර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1081 B 082377 — 403 (2022/09)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2022 අංක 555

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

*2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට තාවකාලික කපිතන් නිලයට* :

නි/6404 ලුතිනන් සෙල්ලනායක මුදියන්සේලාගේ චමීර අමල් සෙනෙවිරත්න
නි/6649 ලුතිනන් මහගමගේ හර්ෂණී නයනමාලි මහගම (ගැ)
නි/6558 ලුතිනන් ජූඩ් ඩික්සන් වාස්
නි/7900 ලුතිනන් දිද්දෙණිය ආරච්චිලාගේ මංජුල පුෂ්පකුමාර
නි/7906 ලුතිනන් හුලංගමුවේ ගෙදර නිශාන්ත දම්මික වීරසේකර
නි/9125 ලුතිනන් පල්දෙණියේ ගෙදර නිහාල් පුෂ්පකුමාර
නි/9550 ලුතිනන් කපුකොටුව මුදියන්සේලාගේ ජයන්ත පුෂ්පකුමාර කපුකොටුව
නි/9347 ලුතිනන් මීපිටියේ ගනේගෙදර සුරංජිත් ප්‍රියන්ත විජේසිරි
නි/7978 ලුතිනන් වීරක්කොඩි මුදියන්සේලාගේ චින්තක නාමල් වීරක්කොඩි
නි/9083 ලුතිනන් කරනැක් ගෙදර සරත් අබේරත්න
නි/9163 ලුතිනන් සභාරත්නම් සදීස්කරන්
නි/10394 ලුතිනන් අලහකෝන් වනිගසූරිය ආරච්චිගේ මනෝජ් සංජීව වංශනාථ
නි/9249 ලුතිනන් විජේලත්ගේ නර්මදා කෞශල්‍යා (ගැ)
නි/6370 ලුතිනන් මොහොමඩ් සහීඩ් මොහොමඩ් කතාෆ්
නි/6590 ලුතිනන් අබේසිංහ මුදියන්සේලාගේ අනුෂා සංජීවනි කුමාරි අබේසිංහ (ගැ)
නි/8118 ලුතිනන් දිසානායක මුදියන්සේලාගේ ජනාදර සේනානායක
නි/10134 ලුතිනන් කොඩිතුවක්කු කංකානම්ගේ තිලංක ඩෙරික් කොඩිතුවක්කු
නි/10166 ලුතිනන් ඥාණමුත්තු ඇන්ටන් චාර්ලස්
නි/10386 ලුතිනන් අලහකෝන් මුදියන්සේලාගේ නුවන් මධුශංක
නි/10444 ලුතිනන් තාන්තුලගේ සුජිත් කුමාර තාන්තුලගේ
නි/10495 ලුතිනන් මයිලිපොඩි ජෙගතරන්
නි/10498 ලුතිනන් පත්මනාදන් පාර්තීපන්

*2021 ඔක්තෝබර් මස 04 වැනි දින සිට තාවකාලික කපිතන් නිලයට* :

නි/10731 ලුතිනන් අසේල නිමේෂ් මධුශාන් පෙරේරා
නි/10732 ලුතිනන් කුඹලාතර ආරච්චිලාගේ නිමල් ශාන්ත කුඹලාතර
නි/10733 ලුතිනන් රෝහණ විතානගේ දිනේෂ් ගාමිණී ජයසිංහ
නි/10734 ලුතිනන් හොරගල ගමගේ කපිල මාතාංග
නි/10737 ලුතිනන් මාරසිංහලාගේ නිලන්ත ධනුවන්ත ප්‍රනාන්දු
නි/10738 ලුතිනන් යද්දෙහිගේ ඉෂාර ලක්මාල්
නි/10739 ලුතිනන් මාරසිංහලාගේ නිරෝෂ ධනුවන්ත ප්‍රනාන්දු
නි/10742 ලුතිනන් දිසානායක වනිගසූරිය මුදියන්සේලාගේ උපුල් දිසානායක
නි/10749 ලුතිනන් සුවන්ද ආරච්චිගේ බුද්ධික චාමර
නි/10755 ලුතිනන් හේරත් මුදියන්සේලාගේ නාමල් සමීර කරුණාරත්න
නි/10759 ලුතිනන් මුණසිංහ යග්ගහවිලගේ චන්දන මධුශංඛ මාබරණ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී
යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ දී ය.

09 - 25

---

2022 අංක 556

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

*2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ලුතිනන් නිලයට* :

නි/7985 දෙවන ලුතිනන් අබ්දුල් රහ්මාන් මොහමඩ් නියාස්
නි/8114 දෙවන ලුතිනන් විජේරත්න ආරච්චිගේ රම්‍යා තරංගනී (ගැ)
නි/8158 දෙවන ලුතිනන් භාග්‍යා සිතුම් කලහගේ පතිරණ (ගැ)
නි/8792 දෙවන ලුතිනන් අබේකෝන් මුදියන්සේලාගේ තුසිත බණ්ඩාර අබේකෝන්
නි/8794 දෙවන ලුතිනන් රුක්මන් සෙනරත් සේනානායකලාගේ අසංක සම්පත් සේනානායක

නි/8852 දෙවන ලුතිනන් වැවේගම්මහේලාගේ ධනපාල ගමගේ
නි/8871 දෙවන ලුතිනන් දිසානායක මුදියන්සේලාගේ රත්නායක බණ්ඩා
නි/8887 දෙවන ලුතිනන් අබ්දුල් මජීඩ් මුහම්මදු කියාස්
නි/9177 දෙවන ලුතිනන් මහරූෆ් නිහාල් හුසේයින්
නි/9303 දෙවන ලුතිනන් වේලුපිල්ලෙයි යෝගකාන්තන්
නි/9314 දෙවන ලුතිනන් කෝනාර මුදියන්සේලාගේ චන්දන සේනාධීර
නි/9326 දෙවන ලුතිනන් අබ්දුල් ගෆූර් මුහමඩ් ඉස්හාක්
නි/10067 දෙවන ලුතිනන් මුහම්මද් මසූර් මුහම්මද් ඉල්හාම්
නි/10735 දෙවන ලුතිනන් සෙනෙවිරත්න බණ්ඩාරගේ අසංක ගැමුණු කුමාර බණ්ඩාර
නි/10745 දෙවන ලුතිනන් ගෝවින්දසාමි ශ්‍රීධරන්
නි/10753 දෙවන ලුතිනන් ජෝන් රගුනන්දන්
නි/10890 දෙවන ලුතිනන් ජයසේකර මුදියන්සේලාගේ අමිල ප්‍රසාද් ජයසේකර
නි/10927 දෙවන ලුතිනන් බමුණුසිංහ ආරච්චිගේ ගයාන් රංගන
නි/10950 දෙවන ලුතිනන් චමින්ද ජානක රණසිංහ
නි/10958 දෙවන ලුතිනන් වජිර ප්‍රියංකර බඹරබොටුව
නි/10975 දෙවන ලුතිනන් රත්නම් ජෙයමදන්
නි/11021 දෙවන ලුතිනන් මැඩිල්ලේ ගෙදර දර්ශන තුසිත කුමාර ගුණරත්න

*2021 සැප්තැම්බර් මස 09 වැනි දින සිට ලුතිනන් නිලයට :*

නි/11023 දෙවන ලුතිනන් වත්තකුවත්ත වඩුගේ දෝන් සුපුනි නිරාෂා පෙරේරා (ගැ)
නි/11024 දෙවන ලුතිනන් මැද්දේගොඩ ගේ අසේල ප්‍රසන්න ගුණතුංග
නි/11029 දෙවන ලුතිනන් ඇනීෂා ෆෙරාරි දේවප්‍රිය (ගැ)
නි/11031 දෙවන ලුතිනන් කන්දේකුඹුර වාරියගොඩ මුදියන්සේලාගේ නිලංක සඳරුවන් කන්දේකුඹුර
නි/11032 දෙවන ලුතිනන් කලුවිල ඉලංගසිංහ මුදියන්සේලාගේ රුවන් කුමාර ඉලංගසිංහ
නි/11033 දෙවන ලුතිනන් හේරත් මුදියන්සේලාගේ සේනාරත්න
නි/11034 දෙවන ලුතිනන් වතුලියද්දෙ දුරයලැ ගෙදර බුද්ධික අරුණ ශාන්ත
නි/11036 දෙවන ලුතිනන් කොස්ගොල්ලැ ගෙදර දීපිකා ප්‍රියදර්ශනී (ගැ)
නි/11040 දෙවන ලුතිනන් සෙනෙවිරත්න මුදියන්සේලාගේ ඩිලාන් මධුශංක සෙනෙවිරත්න
නි/11042 දෙවන ලුතිනන් උඩගේ කන්කානම්ගේ චමින්ද අමිත් කුමාර
නි/11043 දෙවන ලුතිනන් කන්දෙ අප්පුහාමිලාගේ තිලින ලංකා විජේසිංහ
නි/11047 දෙවන ලුතිනන් ආනන්ද මුදියන්සේලාගේ නිලංක වරුණ සංජය
නි/11056 දෙවන ලුතිනන් විග්නරාසා පවීනා (ගැ)
නි/11059 දෙවන ලුතිනන් වෛරම්බු ගෙදර පද්මකීර්ති දිසානායක
නි/11062 දෙවන ලුතිනන් ඉරංග මධුශංඛ හෙට්ටිවත්ත
නි/11064 දෙවන ලුතිනන් මනිමෙල් වඩු ශාන්ත

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී
යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

09 - 26

---

## වෙනත් පත්කිරීම් ආදිය

2022 අංක 557

### අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(3) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ වන මම, පහත සඳහන් නීතිඥ මහත්ම මහත්මීන් අදාළ අධිකරණ කොට්ඨාස සඳහා සමාදාන විනිශ්චයකාර සහ නිලනොලත් මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් පත් කරමි.

| අනු අංකය | නම | ලිපිනය | අධිකරණ කොට්ඨාසය | පත්වීම් දිනය |
|---|---|---|---|---|
| 01. | නීතිඥ වරුණ චන්ද්‍රනාත් වීරසූරිය මහතා | අංක 17, හාල්දඬුවාන, ලුණුවිල. | මාරවිල | 2022.03.11 |
| 02. | නීතිඥ හේනැග්ගේ සුනන්දා පත්මිණි මහත්මිය | අංක 125/ඒ, තඹගමුව, පල්ලෙබැද්ද | ඇඹිලිපිටිය | 2022.03.28 |
| 03. | නීතිඥ ජයවීර මුතුමාල රෝහණ කුමාර මහතා | අංක 667 ඩී, මේපල්ස් පාර, වෙන්නප්පුව | මාරවිල | 2022.04.08 |
| 04. | නීතිඥ වනිගසුන්දර අප්පුහාමිල්ලාගේ දෝන ශශිකලා වනිගසුන්දර මහත්මිය | "සම්මානී", 39/ඊ/1, හඟගල්ල, එල්ලක්කල | අත්තනගල්ල | 2022.04.19 |
| 05. | නීතිඥ වැවල ආරච්චිගේ සම්පත් තෙන්නකෝන් කස්තුරිරත්න මහතා | අංක 534/8, අනගි මාවත, හොරගොල්ල, නිට්ටඹුව | අත්තනගල්ල | 2022.04.19 |
| 06. | නීතිඥ වීරකෝන් මුදියන්සේලාගේ සුනිල් ධර්මපාල වීරකෝන් මහතා | අංක 85/සී ගොහාගොඩ පාර, කටුගස්තොට | මහනුවර | 2022.05.31 |

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
ජනාධිපති නීතිඥ,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2022 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ 10,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දී ය.

09-46

# රජයේ නිවේදන

## උග්ගල් අලුත්නුවර කතරගම දේවාලයේ වාර්ෂික මහ පෙරහැර - 2022

*පෙරහැර පවත්වන කාල සීමාව :*

1. 2022 වසරේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම 2022.08.04 දින සුබ මොහොතින් සිදු කරන ලදී.
   - 2022.09.24 වැනි දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව ද,
   - 2022.09.26 වැනි දින සිට 2022.09.30 වැනි දින දක්වා උඩමළුවේ පෙරහැර ද,
   - 2022.10.01 වැනි දින සිට 2022.10.04 වැනි දින දක්වා දෙවෙලේ පෙරහැර ද,
   - 2022.10.05 වැනි දින සිට 2022.10.09 වැනි දින දක්වා මහා පෙරහැර ද,
   - 2022.10.10 වැනි දින උදෑසන යෙදෙන සුබ මොහොතින් දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීමට නියමිත ය.

*කඳවුරු ප්‍රදේශය යනු :*

2. දේවාල භූමියේ උඩ වීදිය, නැගෙනහිර පෙදෙස හා බටහිර පෙදෙස වන පිරිත්වත්ත, ගල්වත්ත, මළුකාරවත්ත හා උතුරු දෙසින් පිහිටි උඩහගෙදරවත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමිභාගය පෙරහැර පවත්වන කඳවුරු ප්‍රදේශය වේ.

*ආහාර හා ජලය :*

3. විහාර මළුව, බෝ මළුව, චෛත්‍ය මළුව, දේවාලය අවට පහත මාලය, කලායතන රථගෙය, මැදවත්ත හා ඒ අවට ප්‍රදේශ තුළ ආහාර පිසීම තහනම් කෙරේ.

4. අලි ඇතුන් ගාල් කර ඇති ස්ථානවල නිකරුණේ ගැවසීම නොකළ යුතු අතර අවසරලත් අය හැර සතුනට ආහාර සැපයීම නොකළ යුතු ය.

5. පෙරහැර පැවැත්වෙන කාල සීමාව තුළ අවශ්‍ය පානීය ජලය හා අමතර ජල ටැංකි යොදා පහසුකම් සැපයීම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයට හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරමි.

*වෙළෙඳාම හා ගොඩනැගිලි ඉදිකිරීම් :*

6. දේවාල උඩ මළුව, මැද වීදිය, මළුවට පිවිසෙන මාර්ගය හා ඒ දෙපස ප්‍රදේශ තුළ මල්, සුවඳ ද්‍රව්‍ය, ඉටි පන්දම් හා භාර සඳහා අවශ්‍ය පූජා භාණ්ඩ විකිණීම සපුරා තහනම් ය.

7. ඉහත අංක 02 වගන්තියෙහි සඳහන් භූමිය තුළ හෝ වෙනත් කිසිම ස්ථානයක වෙළෙඳාම් කිරීම හා මුදල් උපයන කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.

8. පෙරහැර මංගල්‍යය පවත්වන දිනවල, සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබන මවිසින් ලියාපදිංචි කර ඇති ස්ථිර වෙළෙඳසැල්වල හැර අනෙකුත් වෙළෙඳාම් කටයුතු සිදු කිරීම තහනම්ය.

9. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියෙකුගේ අනුමැතියක් නොමැතිව කිසියම් තැනැත්තකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු අතර, පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

10. මාගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා අනවසර වෙළෙඳාම් කටයුතු තහනම්වන අතර, එසේ කටයුතු / ඉදි කිරීම් සෞඛ්‍ය අංශවල නිර්දේශවලට අනුව පොලීසිය විසින් ඉවත් කරනු ලැබේ.

*වාහන :*

11. පෙරහැර පැවැත්වෙන කාලසීමාව තුළ උත්සව භූමියට වාහන ඇතුළු කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඇසළ උත්සවය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර ඇති වාහනවලට පමණි. ඒ අනුව පහත සඳහන් මාර්ගවල වාහන ගමනාගමනයට ඉඩ දෙනු නොලැබේ.

- කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයෙන් අලුත්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මංසන්ධියෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය
- තොටපල්ල, පොකුණේගම ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.
- පිරිත්වත්ත, ගල්වත්ත ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය

12. ප්‍රධාන මාර්ගයේ පෞද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ බලපතක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුළු කිරීම තහනම් ය.

*ඡායාරූප ගැනීම :*

13. දේවාලයේ දික් ගෙය, මාලිගාවේ ඉහළ මාලය, ඡායාරූප ගැනීම හා රූගත කිරීම අනුමැතියකින් තොරව සිදු කිරීම සපුරා තහනම් කෙරේ.

*විදුලිය පහසුකම් :*

14. දේවාල භූමිය හා අවට මාර්ගයේ වීදි ලාම්පු හා අමතර ලාම්පු සවි කිරීම ලංකා විදුලිබල මණ්ඩලයට හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පවරමි.

*සෞඛ්‍ය පහසුකම් :*

15. පෙරහැර මංගල්‍යයට පෙර හා පසු සෞඛ්‍ය කටයුතු, සනීපාරක්ෂක කටයුතු, ඩෙංගු මර්දන කටයුතු හා අපද්‍රව්‍ය ඉවත් කිරීම ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට හා සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පවරමි.

16. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ බලපවත්වන වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට, විශේෂයෙන්ම කොවිඩ් - 19 වසංගත තත්ත්වයට අදාළ සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලාගත යුතු ය.

*යාචකයෝ :*

17. සිගමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමිය තුළ හෝ කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

*ආරක්ෂාව :*

18. සියලු ආරක්ෂක කටයුතු, පෙරහැරට අවහිර නොවන ලෙස මාර්ගයේ රථවාහන හැසිරවීම ආරක්ෂක අංශ හා පොලීසිය වෙත පවරමි.

*වෙනත් :*

19. රතිඤ්ඤා, වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

ඩී. පී. ජී. රේණුකා,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

09 - 42

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/214/2017/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.09.02** වැනි දින සිට **2022.09.16** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.23** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව*<br>*ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව*<br>*ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව*<br>*ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO 73/51 පත්‍රිරුව. | උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක - 265 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, එගොඩගම පිහිටි " රජයේ ඉඩම"නැමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අංක අයි.එස්.පී.පී. 2 දරන පිඹුරේ අනු/නැනුප/ප්‍ර/483 දීමනා පත්‍රයේ 1995.12.05 දිනැති කැබලි අංක 983 දරන ඉඩමට මායිම්,<br><br>*උතුර* : අයි. එස්. පී. පී. 2හි කැ. අංක 975,<br>*නැගෙනහිර* : අයි. එස්. පී. පී. 2හි කැබලි අංක 980,<br>*දකුණ* : අයි. එස්. පී. පී. 2හි කැබලි අංක 993,<br>*බස්නාහිර* : අයි. එස්. පී. පී. 2හි කැබලි අංක 992 සහ 987.<br><br>බිම් ප්‍රමාණය : රූඩ්. 02, පර්. 07 | 01. ජනාධිපති ලේකම් විසින් 1995.12.05 දින ප්‍රදානය කරන ලද අංක අනු/නැනුප/ප්‍ර/483 දරන දීමනාපත්‍රය. |

09-50

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/87/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.09.02** වැනි දින සිට **2022.09.16** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.23** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A කොට්ඨාසයේ, 119 වෙළුමේ 72 පත්ඉරුව. | මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාව තුළ පත්තුවේ, කබල් කෙස්ගහ මුල වත්ත පිහිටි "කබල් කොස්ගහමුල වත්ත" නමැති ඉඩම බලයලත් මානක ඊ. වී. සිරිසුමන මහතා විසින් 04.09.2005 දින මැන සාදන ලද අංක 6228 දරන පිඹුරේ ලොට් අංක 01 සඳහා මායිම්,<br>*උතුර* : ඩී. එම්. රත්නසීල බණ්ඩා අයිතිකම් කියන වරිපනම් අංක 52 දරන ඉඩම් කොටස ද,<br>*නැගෙනහිර* : රවුම් පාර ද,<br>*දකුණ* : පාර ද,<br>*බස්නාහිර* : නන්දනී මැණිකේ අයිතිකම් කියන ඉඩම ද,<br>බිම් ප්‍රමාණය : පර්. 06.5 | 01. ඒ. එම්. විජේතිලක ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2005.10.18 දින ලියා සහතික කරන ලද අංක 12213 දරන විකුණුම් ඔප්පුවයි. |

09 - 51

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/69/2021/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.09.02** වැනි දින සිට **2022.09.16** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.23** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව*<br>*ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව*<br>*ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව*<br>*ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 27/15 පත්‍රිරුව. | ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 329 හිරිපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, හිරිපිටිය පිහිටි "නාරංගහවත්ත" නමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අංක මුපිගම් 528 දරන පිඹුරේ කැබලි අංක 94 දරන ඉඩමට මායිම්,<br><br>*උතුර* : කට්ටි අංක 90 සහ 89,<br>*නැගෙනහිර* : කට්ටි අංක 95,<br>*දකුණ* : ප්‍රවේශ මාර්ගය,<br>*බස්නාහිර* : කට්ටි අංක 93,<br><br>බිම් ප්‍රමාණය : හෙක්ටයාර් 0.049 | 01. ජනාධිපති ලේකම් විසින් 1984.10.16 දින ප්‍රදානය කරන ලද අංක ගම්/ප්‍ර 3610 දරන දීමනාපත්‍රය. |

09 - 52

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/28/2022/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.09.02** වැනි දින සිට **2022.09.16** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.23** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1379 වෙළුමේ 278 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, හික්ගහ වත්ත නැමැති ඉඩමට බලයලත් මානක ඩී. ඩබ්. අබේසිංහ මහතා විසින් අංක 1144/1983.03.10 දින මැන සාදන ලද ලොට් ඒ සඳහා මායිම්,<br>*උතුර* : දෙල්ගහඕවිට,<br>*නැගෙනහිර* : මෙම ඉඩමේ කැබැල්ල,<br>*දකුණ* : ලොට් බී,<br>*බස්නාහිර* : නාලන්දා පාර හා කේ. ඩී. කරලැයින්ට අයිති දේපළ,<br>බිම් ප්‍රමාණය : රූ. 01, පර්. 24.50 | 01. එස්. ඩබ්. කේ. එච්. සමරනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1992.04.16 දින ලියා සහතික කරන ලද අංක 151 දරන විකුණුම් ඔප්පුව<br>02. ආර්. ඩබ්. කේ. එච්. සමරනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1995.04.29 දින ලියා සහතික කරන ලද අංක 197 දරන ප්‍රකාශන ඔප්පුව<br>03. ආර්. එස්. විජේසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1996.03.01 දින ලියා සහතික කරන ලද අංක 683 දරන ප්‍රකාශන ඔප්පුව. |

09 - 53

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - චුන්නාකම් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

සුන්තරලිංගම් රවිචන්ද්‍රන්
ජෙයලෙච්චුමි රවිචන්ද්‍රන්

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් සුන්තරලිංගම් රවිචන්ද්‍රන් සහ ජෙයලෙච්චුමි රවිචන්ද්‍රන් වෙත ප්‍රදානය කරන ලද රු. 5,400,000.00ක වාරික ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, යාපනය ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සිවරාමසර්මා විසින් දෙකම ලියා සහතික කරන ලද අංක 555 හා 2014.10.27 දින දරන උකස් බැඳුම්කරය සහ අංක 1717 හා 2018.03.22 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ අනායිකොඩ්ඩායි හි ප්‍රසිද්ධ නොතාරිස් එම්. ත්‍යාගරාජා විසින් ලියා සහතික කරන ලද අංක 13537 හා 2011.08.27 දින දරන උකස් බැඳුම්කරය සහ යාපනය ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සිවරාමසර්මා විසින් ලියා සහතික කරන ලද අංක 1716 හා 2018.03.22 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සුන්දරලිංගම් රවිචන්ද්‍රන් සහ ජෙයලෙච්චුමි රවිචන්ද්‍රන් ණයකරුවන් වශයෙන් උකස්කර බැඳ තබා තිබේ.

තව ද, එකී සුන්දරලිංගම් රවිචන්ද්‍රන් සහ ජෙයලෙච්චුමි රවිචන්ද්‍රන් යන අය විසින් එකී උකස්බැඳුම්කර මත සහ රු. 5,400,000.00ක එකී වාරික ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී උකස් බැඳුම්කර මත 2022 මැයි 19 වැනි දිනට රුපියල් මිලියන පහයි හත් ලක්ෂ පහළොස් දහස් එකසිය විසි හයයි ශත හතලිහ (රු. 5,715,126.40)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 5,273,790.04ක ප්‍රාග්ධන හිඟය මත 2022 මැයි 20 වැනි දින සිට වර්ෂයකට AWPLR + 3% (වර්ෂයකට 19.38%)ක අනුපාතයට තවදුරටත් පොලිය ද සමඟ එකී රු. 5,715,126.40ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 555, 1717, 13537 හා 1716 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි පළමුවන සහ දෙවන උපලේඛනවල විස්තර කර ඇති දෙපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### පළමුවන උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, තෙන්මරද්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ චාවකච්චේරි ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ කයිතාඩි දකුණු නැගෙනහිර (ජේ/292) ග්‍රාම නිලධාරි වසම තුළ නාවත්කුලි පාරිෂ් හි කයිතාඩි හි පිහිටි "මලනාර් වලව් සහ පුලම් සහ තෝඩ්ඩම්" නමැති විශාලත්වයෙන් 03 L ms V C ක් වූ නමුත්, එකී ඉඩම හා පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු වී. පරමලිංගම් විසින් සාදන ලද අංක 346 හා 2008.07.05 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, නැගෙනහිරට : පාර ද, උතුරට : රත්නම් අරුන්දවකුමාර්ගේ දේපළ ද, බස්නාහිරට සහ දකුණට : සරවනමුතු සෙල්ලතුරෙයි සහ බිරිඳ අන්නම්මාගේ උරුමකරුවන්ගේ දේපළ ද මායිම් වූ ලාච්චම් වරගු කල්චර් දෙකයි කුලීස් දහහතරයි දශම දෙකයි හයක් (02 L ms V C සහ 14.26 KI s) විශාලත්වයෙන් යුත් ඉඩමේ සියල්ල සහ ඒ තුළ පිහිටි නිවාස, ළිඳ, ගහකොළ, වගාවන් ඇතුළු සැම සියලු දේද සමඟ වේ. මෙය යාපනය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එෆ් 880/133හි ලියාපදිංචි වී තිබේ.

### දෙවන උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, විලිකාමම් දකුණු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොට්ඨාස අංක 07හි වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ ඉනුවිල් බටහිර (ජේ/191) ග්‍රාම නිලධාරි වසම තුළ වරිපනම් අංක 71, පාප්පා තෝඩ්ඩා පටුමග දරුණ උඩුවිල් පාරිෂ් හි ඉනුවිල් හි පිහිටි, "පාප්පාතෝඩ්ඩම්" නමැති ඉඩම හා පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු එම්. රාසයියා විසින් සාදන ලද අංක 971ඒ හා 2011.03.06 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, නැගෙනහිරට : කනපතිපිල්ලෙයි කනේසු සහ ෂන්මුගනාතන්ගේ බිරිඳ නල්ලයිනායකිගේ දේපළ ද, උතුරට : කනපතිල්ලෙයි කනේසු සහ සුබ්‍රමනියම් විවේකනාතන්ගේ දේපළ සහ පාප්පා තෝඩ්ඩා පටුමග ද, බස්නාහිරට : සුබ්‍රමනියම් විවේකනාතන්

සහ මයිල්වාගනම් කබිලාන්ගේ දේපළ සහ දකුණට : කුලන්තායිවේලුගේ බිරිඳ වන කමලම්බාල්ගේ දේපළ ද මායිම්වූ ලාච්චම් වර්ගු කල්වර් තුනයි කුලීස් පහයි දශම පහක (03 L ms V C සහ 05.50 KI s) විශාලත්වයෙන් යුත් ඉඩමේ සියල්ල සහ බස්නාහිර මායිමේ, පිහිටා ඇති ළිඳේ භාග කොටස සමඟ ඒ තුළ පිහිටි නිවාස, වගාවන්, ගහකොළ ඇතුළු සෑම සියලු දේද සමග වේ. මෙය යාපනය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ජේ 74/04 හි ලියාපදිංචි වී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

09 - 08/1

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මනිපේ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයි.

අද්දර පතිරනගේ සුදේශ්

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අද්දර පතිරනගේ සුදේශ් වෙත ප්‍රදානය කරන ලද රු. 14,000,000.00 (රුපියල් මිලියන දහහතර)ක නිවාස ණය පහසුකමක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් ලියා සහතික කරන ලද අංක 7123 හා 2017.12.14 දින දරන උකස් බැඳුම්කරය මගින් අද්දර පතිරනගේ සුදේශ් ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී අද්දර පතිරනගේ සුදේශ් යන අය විසින් එකී නිවාස ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2022.05.13 වැනි දිනට රු. 13,052,851.68 (රුපියල් මිලියන දහතුනයි පනස් දෙදහස් අටසිය පනස් එකයි ශත හැට අට)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු එතෙක් කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට විකුණුම් දිනය දක්වා රු. 12,652,178.34ක ප්‍රාග්ධන හිඟය මත 2022.05.14 වැනි දින සිට වර්ෂයකට 15.75%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 13,052,851.68ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 7123 දරන, බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති එකී නේවාසික සහාධිපත්‍ය ඒකකයේ ව්‍යවස්ථාපිත පොදු උපාංග සමග මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති නේවාසික සහාධිපත්‍ය ඒකකය, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. කුමාරි මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ දෙහිවල ගල්කිස්ස මහනගර සභා පාලන සීමාව තුළ 541 - ගල්කිස්ස ග්‍රාම නිලධාරී වසම තුළ වරිපනම් අංක 12-2/1, ද සේරම් පාර, ගල්කිස්ස පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කනගසිංහම් විසින් සාදන ද අංක 5051 හා 2017 මැයි 02 දින දරන සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එස්එෆ්05 දරන දෙවන මහලේ පිහිටි නේවාසික සහාධිපත්‍ය කොටසට මායිම් වශයෙන්,

උතුරට : මෙම සහාධිපත්‍ය කොටස සහ එස්එෆ්06 දරන සහාධිපත්‍ය කොටස අතර බිත්තියේ මධ්‍යය, සීඑ18 සහ සීඑ14 (එස්ඩබ්) ද, නැගෙනහිරට : මෙම සහාධිපත්‍ය කොටස සහ සීඑ 2හි විවෘත අවකාශය අතර බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම සහාධිපත්‍ය කොටස සහ වරිපනම් අංක 14ඒ, ද සේරම් පාර දරන පරිශ්‍රය වෙන්කෙරෙන බිත්තියේ මධ්‍යය සහ මෙම සහාධිපත්‍ය කොටස සහ සීඑ9හි විවෘත අවකාශය අතර බිත්තියේ මධ්‍යය ද, බස්නාහිරට : මෙම සහාධිපත්‍ය කොටස සහ එස්එෆ්06 දරන සහාධිපත්‍යය කොටස අතර බිත්තියේ මධ්‍යය සහ සීඑ7හි විවෘත අවකාශය ද, පහළට (යට) : එෆ්එෆ්01 සහාධිපත්‍යය ඒකකයට ඉහළින් පිහිටි මෙම සහාධිපත්‍යය කොටසේ කොන්ක්‍රීට් බිමේ මධ්‍යය ද, මුදුනට (ඉහළ) : ඉහළ ටීඑෆ්09 සහාධිපත්‍ය ඒකකයේ කොන්ක්‍රීට් බිමේ මධ්‍යය ද, මායිම් වූ වර්ග මීටර් 111.48ක් හෙවත් වර්ග අඩි 1200ක් විශාලත්වයෙන් යුත් බිම් ප්‍රදේශය.

එස්එෆ්05 දරන සහාධිපත්‍ය ඒකකයට විසිත්ත හා කෑම කාමරයක්, නිදන කාමර තුනක්, පැන්ට්‍රියක්, වැසිකිළි 2ක් සහ

සඳළුතල ඇතුළත් වේ. සහාධිපත්‍ය දේපළේ පොදු උපාංග වලින් එස්එෆ් 05 දරන මෙම සහාධිපත්‍ය ඒකකය සඳහා නොබෙදූ කොටස් වටිනාකම 4.530% වේ. එස්එෆ් 05 දරන සහාධිපත්‍ය කොටසට ආසන්නම පොදු ප්‍රවේශ එස්එෆ් 18 වේ.

## දෙවන උපලේඛනය

2003 අංක 39 දරන බද්ද නිවාස අයිතිකම් (සංශෝධන) පනතින් සහ 1982 අංක 45 දරන (සංශෝධන) පනතේ 12 වන වගන්තිය මගින් සංශෝධනය කරන ලද පරිදි, 1973 අංක 11 දරන බද්ද නිවාස අයිතිකම් නීතියේ 26 වගන්තියේ දක්වා ඇති පරිදි සහාධිපත්‍ය දේපළේ ව්‍යවස්ථාපිත පොදු උපාංග.

1. සහාධිපත්‍ය දේපළට අනුබැඳි විවෘත අවකාශ ඇතුළත් ගොඩනැගිල්ල පිහිටි ඉඩම.

2. අත්තිවාරම්, කණු, බාල්ක, මහබාල්ක, ආධාරක, ප්‍රධාන බිත්ති සහ ගොඩනැගිල්ලේ වහලය.

3. විදුලිය, දුරකථන, ගුවන්විදුලි පැතිරයාමේ, රූපවාහිනිය, ජලනල, ජල ටැංකි, වතුරවල, ඉහළින් ඇති වතුර ටැංකි, පොම්පාගාරය, නල, කසළ මාර්ග, කාණු කවාට සහ කසළ බැහැර කිරීම් වැනි මධ්‍ය සේවා ස්ථාපන කිරීම්.

4. එහි පැවැත්මට, නඩත්තුවට සහ ආරක්ෂාවට හෝ සාමාන්‍ය පොදු පාවිච්චිය සඳහා අවශ්‍ය හෝ පහසු දේපළේ අනිකුත් සියලුම කොටස් සහ පහසුකම්.

පිඹුරේ 05 සිට 22 දක්වා පිටුවල පෙන්වා ඇති ප්‍රදේශ තුළ ඇති පොදු උපාංග හඳුන්වාදීම සහ විස්තර කිරීම.

| | | | |
|---|---|---|---|
| CE1 | : | (අ) | එය උතුරු මායිම දිගේ ඇති ඉඩම හා විවෘත අවකාශයක් වේ |
| | | (ආ) | වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය |
| | | (ඇ) | වාහන නැවැත්වීම සඳහා ප්‍රවේශයක් සහ ධාවන පථයක් වශයෙන් පොදුවේ පාවිච්චි කිරීම සඳහා වන ඉඩම වේ |
| CE2 | : | (අ) | එය නැගෙනහිර මායිම දිගේ පිහිටි ඉදිරිපිට ඇති ඉඩම හා විවෘත අවකාශයක් වේ. |
| | | (ආ) | එය සහාධිපත්‍යය දේපළට අනුබැඳි වේ. |
| CE3 | : | (අ) | එය උතුරු මායිම දිගේ ඇති ඉඩම හා විවෘත අවකාශයක් වේ |
| | | (ආ) | වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය |
| | | (ඇ) | ඉඩම වාහන නැවැත්වීමට පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE4 | | (අ) | එය ඉඩම හා විවෘත අවකාශයක් වේ |
| | | (ආ) | වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය |
| | | (ඇ) | ඉඩම පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE5 | | (අ) | එය ඉඩම හා විවෘත අවකාශයක් වේ |
| | | (ආ) | වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය |
| | | (ඇ) | ඉඩම පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE6 | | (අ) | එය ඉඩම හා විවෘත අවකාශයක් වේ |
| | | (ආ) | වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය |
| | | (ඇ) | ඉඩම පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE7 | | (අ) | එය ඉඩම හා විවෘත අවකාශයක් වේ |
| | | (ආ) | වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය |
| | | (ඇ) | ඉඩම පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE8 | | (අ) | එය ඉඩම හා විවෘත අවකාශයක් වේ |
| | | (ආ) | වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය |
| | | (ඇ) | ඉඩම පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |

| | | | |
|---|---|---|---|
| CE9 | | (අ) | එය ඉඩම හා විවෘත අවකාශයක් වේ |
| | | (ආ) | වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය |
| | | (ඇ) | ඉඩම පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE10 | | (අ) | එය බිම් මහලේ ආවරණය කර ඇති පෙදෙසක් වේ |
| | | (ආ) | වාහන නැවැත්වීම සඳහා ප්‍රවේශයක් සහ ධාවන පථයක් වශයෙන් පොදුවේ පාවිච්චි කිරීම සඳහා වන ඉඩම වේ |
| CE11 | | (අ) | එය බිම් මහලේ ආරක්ෂක මුරපොලක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE12 | | (අ) | එය බිම් මහලේ වැසිකිළියක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE13 | | (අ) | එය කුණු කසළ කාමරය වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE14 | | (අ) | එය සියලුම මහල් සඳහා දිවෙන පඩිපෙළක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE15 | | (අ) | එය සියලුම මහල් සඳහා දිවෙන සෝපානයක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE16 | | (අ) | එය මැසනයින් මහල්වල නඩත්තු/ කම්ටු කාර්යාලයක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE17 | | (අ) | එය පළමු මහලේ ප්‍රවේශ ශාලාව් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| | | (ඇ) | එය එෆ්එෆ්05 සිට එෆ්එෆ්08 දක්වා සහාධිපත්‍ය කොටස් සඳහා ආසන්න පොදු ප්‍රවේශ පෙදෙසක් වේ |
| CE18 | | (අ) | එය දෙවන මහලේ ප්‍රවේශ ශාලාවක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| | | (ඇ) | එය එෆ්එෆ්05 සිට එෆ්එෆ්08 දක්වා සහාධිපත්‍ය කොටස් සඳහා ආසන්න පොදු ප්‍රවේශ පෙදෙසක් වේ |
| CE19 | | (අ) | එය තුන්වන මහලේ ප්‍රවේශ ශාලාවක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| | | (ඇ) | එය එෆ්එෆ්09 සිට එෆ්එෆ්12 දක්වා සහාධිපත්‍ය කොටස් සඳහා ආසන්න පොදු ප්‍රවේශ පෙදෙසක් වේ |
| CE20 | | (අ) | එය හතරවන මහලේ ප්‍රවේශ ශාලාවක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| | | (ඇ) | එය එෆ්එෆ්13 සිට එෆ්එෆ්16 දක්වා සහාධිපත්‍ය කොටස් සඳහා ආසන්න පොදු ප්‍රවේශ පෙදෙසක් වේ |
| CE21 | | (අ) | එය පස්වන මහලේ ප්‍රවේශ ශාලාවක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| | | (ඇ) | එය එෆ්එෆ්17 සිට එෆ්එෆ්20 දක්වා සහාධිපත්‍ය කොටස් සඳහා ආසන්න පොදු ප්‍රවේශ පෙදෙසක් වේ |
| CE22 | | (අ) | එය හයවන මහලේ ප්‍රවේශ ශාලාවක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| | | (ඇ) | එය එෆ්එෆ්21 සිට එෆ්එෆ්24 දක්වා සහාධිපත්‍ය කොටස් සඳහා ආසන්න පොදු ප්‍රවේශ පෙදෙසක් වේ |
| CE23 | | (අ) | එය ඉහළ තට්ටුව මත ප්‍රවේශ ශාලාවක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |
| CE24 | | (අ) | එය ගොඩනැගිල්ලේ මුදුන මත ටෙරසයක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |

| | | | |
|---|---|---|---|
| CE24 | | (අ) | එය ගොඩනැගිල්ලේ මුදුන මත ටෙරසයක් වේ |
| | | (ආ) | එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා වේ |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)/මාණ්ඩලික ලේකම්.

09 - 08/2

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කිරිදිවැල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

වික්‍රම ආරච්චිගේ අනුර පුෂ්ප කුමාර

2022 ජූනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වික්‍රම ආරච්චිගේ අනුර පුෂ්ප කුමාර වෙත ප්‍රදානය කරන ලද රු. 44,886,000.00ක වාරික ණය ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 8428 හා 2011.02.24 දින දරන, අංක 10907 හා 2014.05.09 දින දරන, අංක 11419 හා 2014.12.17 දින දරන සහ අංක 13387 හා 2017.11.22 දින දරන උකස් බැඳුම්කර මගින් වික්‍රම ආරච්චිගේ අනුර පුෂ්ප කුමාර ණයකරු වශයෙන් මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වික්‍රම ආරච්චිගේ අනුර පුෂ්ප කුමාර වෙත ප්‍රදානය කරන ලද ඉහත කී රු. 44,886,000.00ක වාරික ණය ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 7339 හා 2009.05.13 දින දරන, අංක 7748 හා 2010.03.05 දින දරන සහ අංක 8427 හා 2011.02.20 දින දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කියු. ටී. තිසේරා විසින් ලියා සහතික කරන ලද අංක 9891 හා 2012.04.26 දින දරන සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 10905 හා 2014.05.09 දින දරන, අංක 11417 හා 2014.12.17 දින දරන, අංක 13388 හා 2017.11.22 දින දරන හා අංක 13989 හා 2018.11.12 දින දරන උකස් බැඳුම්කර මගින් වික්‍රම ආරච්චිගේ අනුර පුෂ්ප කුමාර ණයකරු වශයෙන් මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වික්‍රම ආරච්චිගේ අනුර පුෂ්ප කුමාර වෙත ප්‍රදානය කරන ලද ඉහත කී රු. 44,886,000.00ක වාරික ණය ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස පී. එන්. ඒකනායක විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 10418 හා 2013.10.04 දින දරන, අංක 10906 හා 2014.05.09 දින දරන සහ අංක 11418 හා 2014.12.17 දින දරන උකස් බැඳුම්කර මගින් වික්‍රම ආරච්චිගේ අනුර පුෂ්ප කුමාර ණයකරු වශයෙන් මෙහි තුන්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී වික්‍රම ආරච්චිගේ අනුර පුෂ්ප කුමාර යන අය විසින් එකී බැඳුම්කර මත සහ රු. 44,886,000.00ක එකී වාරික ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 අප්‍රේල් 25 වැනි දිනට රු. 46,309,521.36 (රුපියල් මිලියන හතලිස් හයයි තුන් ලක්ෂ නම දහස් පන්සිය විසි එකයි ශත තිස් හය)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 44,886,000.00ක ප්‍රාග්ධන හිඟය මත වර්ෂයකට 10.5%ක අනුපාතයට තවදුරටත් පොලිය ද සමඟ එකී

රු. 46,309,521.36ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 8428, 10907, 11419, 13387, 7339, 7748, 8427, 9891, 10905, 11417, 13388, 13989, 10418, 10906 සහ 11418 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි පළමුවන, දෙවන සහ තුන්වන උපලේඛනවල විස්තර කර ඇත දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහර ප්‍රාදේශීය සභාවේ, උරුවල්පේරුව උපකාර්යාල සීමාව තුළ අංක 296ඒ - බලිවිල (උ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බලිවිල පිහිටි "දොඹගහලන්ද" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද අංක 11875 හා 2010 නොවැම්බර් 12 දින දරන පිඹුරේ ලොට් බී වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම්. පී. සෝමාවතී, එම්. පී. ජයරත්න, ඩබ්. ඒ. කරුණාරත්න, ඩබ්. ඒ. ගුණවර්ධන සහ ඩබ්. ඒ. ආරියසේනට අයිති ඉඩම සහ පාර ද, නැගෙනහිරට : ඩබ්. ඒ. ආරියසේනගේ කිස්සියේගෙදර වත්ත ද, දකුණට : පාර සහ ලොට් සී ඩී (අඩි 12-15 පළල පාර) සහ ලොට් ඒ සහ බස්නාහිරට : අංක 4722 දරන පිඹුරේ එස්. එච්. රංජිත් බොනිපස් ප්‍රනාන්දුගේ ලොට් 1න් ද මායිම් වූ එකී අංක 11875 දරන පිඹුර ප්‍රකාරව රූඩ් තුනයි පර්චස් තිස් පහයි දශම පහයි හය (අ.0, රූ.3, පර්. 35.56)ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ. මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම එම් 189/3 යටතෙ ලියාපදිංචි වී තිබේ.

අංක 11875 දරන පිඹුරේ ලොට් ඩී මතින් වන මාර්ග අයිතිය සහ අංක 11875 දරන පිඹුරේ පෙන්වා ඇති අනිකුත් මාර්ග සඳහා වෙන්කිරීම ද සමග වේ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහර ප්‍රාදේශීය සභාවේ, උරුවල්පේරුව උපකාර්යාල සීමාව තුළ අංක 292බී - විලිම්බුල (උ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ විලිම්බුල පිහිටි "එඩිත්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද අංක 10906 හා 1992 සැප්තැම්බර් 07 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : අංක 9220 දරන පිඹුරේ ලොට් ඩී2 ද, දකුණට : ලොට් 6 සහ බස්නාහිරට : ලොට් 2න්ද මායිම් වූ එකී අංක 10906 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහනමය (පර්. 19)ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ. මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම එම් 560/07 යටතේ ලියාපදිංචි වී තිබේ.

ඉහත කී දේපළ මෑතකදී කරන ලද මැනීමකට අනුව බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්. සූරියාරච්චි විසින් සාදන ලද අංක 3917 හා 2008 දෙසැම්බර් 04 දින දරන පිඹුරේ පෙන්වා ඇති අතර, එය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහර ප්‍රාදෙශීය සභාවේ උරුවල්පේරුව උප කාර්යාල සීමාව තුළ 292බී - විලිම්බුල (උ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ විලිම්බුල පිහිටි "එඩිත්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමේ ලොට් 1ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රධාන පාර සහ අංක 9220 දරන පිඹුරේ ලොට් ඩී2 (අඩි 20ක පළල පාර) ද, නැගෙනහිරට : අංක 9220 දරන පිඹුරේ ලොට් ඩී2 (අඩි 20ක් පළල පාර) ද, දකුණට : අංක 10906 දරන පිඹුරේ ලොට් 6 සහ බස්නාහිරට : අංක 10906 දරන පිඹුරේ ලොට් 2 ද මායිම් වූ එකී අංක 3917 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහනමයක් (පර්. 19) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

### තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහර ප්‍රාදේශීය සභාවේ, උරුවල්පේරුව උපකාර්යාල සීමාව තුළ අංක 292බී - විලිම්බුල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ විලිම්බුල පිහිටි "එඩිත්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද අංක 9219 හා 1990 ඔක්තෝබර් 12 දින දරන පිඹුරේ ලොට් සී 6 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් සී 1 ද, නැගෙනහිරට : ලොට් සී 5 ද, දකුණට : ලොට් සී 8 සහ බස්නාහිරට : අංක 9220 දරන පිඹුරේ ලොට් ඩී 2 ද මායිම් වූ එකී අංක 9219 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම පහයි බිංදුව (පර්. 12.50)ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ. මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම එම් 126/50 යටතේ ලියාපදිංචි වී තිබේ.

ඉහත කී දේපළ මෑතකදී කරන ලද මැනීමකට අනුව බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද අංක 12082 හා 2011 අගෝස්තු 31 දින දරන පිඹුරේ පෙන්වා ඇති අතර, එය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහර ප්‍රාදේශීය සභාවේ, උරුවල්පේරුව උපකාර්යාල සීමාව තුළ අංක 292බී - විලිම්බුල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ විලිම්බුල පිහිටි "එඩිත්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමේ ලොට් සී6ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට ඃ අංක 9219 දරන පිඹුරේ ඩී. එල්. සී. මල්ලිකාගේ ලොට් සී 1 ද, නැගෙනහිරට ඃ අංක 9219 දරන පිඹුරේ ලොට් සී 5 ද, දකුණට ඃ අංක 9219 දරන පිඹුරේ කේ. ඒ. දයාවතීගේ ලොට් සී 8 සහ බස්නාහිරට ඃ අංක 9220 දරන පිඹුරේ ලොට් ඩී 2 (අඩි 20ක් පළල ප්‍රාදේශීය සභා පාර) ද මායිම් වූ එකී අංක 12082 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම හතරයි හය (පර් 12.46)ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අංක 9229 දරන පිඹුරේ ලොට් ඩී2 මතින් වන මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

09 - 08/3

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **සැප්තැම්බර්** | 2022.09.02 | සිකුරාදා | 2022.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.09 | සිකුරාදා | 2022.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.16 | සිකුරාදා | 2022.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.23 | සිකුරාදා | 2022.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.30 | සිකුරාදා | 2022.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2022.10.07 | සිකුරාදා | 2022.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.14 | සිකුරාදා | 2022.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.21 | සිකුරාදා | 2022.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.28 | සිකුරාදා | 2022.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2022.11.04 | සිකුරාදා | 2022.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.11 | සිකුරාදා | 2022.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.18 | සිකුරාදා | 2022.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.25 | සිකුරාදා | 2022.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.